**දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව - 2021**

-------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

------------------------------

දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

------------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) මහා නගර සභාවේ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනැති හා අංක 4/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ උපදෙස් පරිදි, 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී ආයතනය සතු සියලු ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කළ යුතු බව පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ 2021 පෙබරවාරි 01 දිනැති හා අංක LGD/10A/4/න.ගි/2019 දරන ලිපිය අනුව දන්වා ඇතත් මහා නගර සභාව විසින් 2021 වර්ෂයේ ද වත්කම් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | වත්කම් ප්‍රත්‍යාගණනයට අදාළ කමිටුවක් පත්කර ගැනීමෙන් අනතුරුව මෙම වත්කම් ප්‍රත්‍යාගණනය සිදු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව නොපමාව ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | යන්ත්‍ර හා උපකරණ, ලිබඩු හා සවිකිරීම්, කාර්යාල උපකරණ හා පරිගණක මෘදුකාංග වටිනාකම ප්‍රත්‍යාගණනය කිරීමෙන් තොරව පෙර වර්ෂයෙන් ඉදිරියට ගෙනා ශේෂයම දේපළ, පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර තිබුණි. එමෙන්ම ඉඩම්, ගොඩනැගිලි, පාරවල් හා පාලම්, අනිකුත් යටිතල පහසුකම් ආදිය ද වටිනාකම් දක්වා දේපළ, පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | රටේ පැවැති කොරෝනා තත්වය සමඟ 2021 වර්ෂයේ බොහෝ මාස වල නිරෝධායන ඇඳිරි නීතිය ක්‍රියාත්මක වීමත් සමඟ මෙම වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේ කටයුතු 2021 වර්ෂය තුළ කර ගැනීමට නොහැකි වූ අතර 2022 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී නිවැරදිව ප්‍රත්‍යාගණනය කර වත්කම් ගිණුම්ගත කරන බව කාරුණිකව දන්වමි. | ඉඩම්, ගොඩනැගිලි, පාරවල් හා පාලම්, අනිකුත් යටිතල පහසුකම් ආදිය ද වටිනාකම් දක්වා දේපළ, පිරියත හා උපකරණ යටතේ නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත හා පළාත් පාලන කොමසාරිස්ගේ 2021 පෙබරවාරි 12 දිනැති හා අංක LGD/10A/4/න.ගි/2019 දරන ලිපියේ 3.5 ඡේදයේ අනුව මිලදී ගන්නා වත්කම් මිලදි ගත් දිනය නොසලකා එම වර්ෂය තුළ දී ක්ෂය කිරීම සිදු නොකරන අතර ඉවත් කරන වර්ෂයේ සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය කළ යුතු බව දක්වා තිබුණි. නමුත් ඊට පටහැනිව 2021 වර්ෂයේ මිලදී ගැනීම් සඳහා රු.1,879,805 ක් වර්ෂයේ ක්ෂයවීම් ලෙස ගිණුම්ගත කර තිබූ අතර 2020 වර්ෂයේ හා ඊට පෙර මිලදීගත් වත්කම් සඳහා ක්ෂයවීම් සමාලෝචිත වර්ෂයේදී ගිණුම්ගත කර නොතිබුණි. | මිලදී ගත් වර්ෂය තුළදී ක්ෂය කිරීම හා සමුච්චිත ක්ෂය ගිණුම්ගත කිරීමේදී සිදුවී ඇති වරද පිළිගනිමි. එය 2022 වර්ෂයේදී නිවැරදි කර ගිණුම් තබන බව දන්වා සිටිමි. | වත්කම් මිලදි ගන්නා වර්ෂයේදී ක්ෂය නොකළ යුතු අතර අපහරණය කරන වර්ෂයේ සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය කර නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඈ) | 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය අනුව දේපළ, පිරියත හා උපකරණ වටිනාකම රු.201,869,692 ක් වුවද සටහන් අංක 16 අනුව දේපළ, පිරියත හා උපකරණ ශුද්ධ වටිනාකම රු.681,718,519 ක් වුයෙන් රු.479,848,827 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | පරිගණකගත කිරීමේදී වෙනත් වටිනාකමක් වැරදි ලෙස ගණුම්ගත වීමෙන් මෙම වරද සිදුවී ඇත. 2022 වර්ෂයේ දී නිවැරදි කර ගිණුම් තබන බව දන්වා සිටිමි. | දේපළ, පිරියත හා උපකරණ නිවැරදි වටිනාකම නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඉ) | 2021 වර්ෂයේදී රු.1,744,566 ක් වටිනා පුස්තකාල පොත් මිලදීගෙන තිබූ අතර පෙර වර්ෂවල මිලදී ගත් පොත් ද සමඟ වටිනාකම දක්වා පුස්තකාල පොත් දේපළ, පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර නොතිබුණි. ඒ හේතුවෙන් ඒ සඳහා ක්ෂයවීම් ද කර නොතිබුණි. | පුස්තකාල පොත් දැනට ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොමැති අතර ඒ පිළිබඳ සළකා බලා 2022 වර්ෂයේදී නිවැරදි කර ගිණුම් තබන බව දන්වා සිටිමි. | පුස්තකාල පොත් වත්කමක් ලෙස දේපළ, පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඊ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව අයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය රු.89,833,747 ක් වුවද සත්‍ය වශයෙන් ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් | වත්කම් හා වගකීම් ප්‍රකාශනයේ සිදුවී ඇති වෙනස්කම් නිවැරදි කිරීමෙන් අනතුරුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇති රු.89,833,747 ක මුදල් ප්‍රවාහය නිවැරදි | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් නිවැරදිව ගණනය කර වාර්තා ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගලායාම රු.120,124,808 ක් වූයෙන් ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය රු.3,029,061 ක් අඩුවෙන් සටහන් කර තිබුණි. | කළහැකි බව දන්වා සිටිමි. | |
| (උ) | මූල්‍ය ප්‍රකාශන සඳහා ණයහිමි ප්‍රතිපාදන සැළසීමේදී ගෙවිය යුතු පාර්ශව, ගෙවිය යුතු මුදල හා ගෙවිය යුතු වැය ශීර්ෂය නිසි පරිදි හඳුනා ගැනීමෙන් තොරව ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේදී ණයහිමි අධි වෙන්කිරීම් වෙනුවෙන් සමුච්චිත අරමුදලට රු.101,000,493 ක බැර කිරීම් සහ ණයහිමි ඌන වෙන්කිරීම් වෙනුවෙන් රු.171,504,093 ක හර කිරීම් සිදුකර තිබුණි. | ගිණුම්ගත කිරිමේදී හර බැර සටහන් මාරු වී සටහන් වීමෙන් මෙම වරද සිදු වී ඇත. 2022 වර්ෂයේ දී නිවැරදි කර ගිණුම් තබන බව දන්වා සිටිමි. | ණයහිමි ප්‍රතිපාදන සැළසීමේදී ගෙවිය යුතු පාර්ශව, ගෙවිය යුතු මුදල හා ගෙවිය යුතු වැය ශීර්ෂය නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඌ) | සමාලෝචිත වර්ෂය අවසානයේ උපලේඛන අනුව හිඟ කඩකුලි ශේෂය රු.9,210,258 ක් වුවද මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂය රු.477,134 ක් වුයෙන් ලැබිය යුතු ශේෂය රු.8,733,124 ක වෙනසක් නිරීක්ෂණය විය. | ගිණුම්කරණ අඩුපාඩු පිළිබඳ සලකා බලා 2022 වර්ෂයේ දී නිවැරදි කර ගිණුම් තබන බව දන්වා සිටිමි. | උපලේඛන අනුව හිඟ ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (එ) | සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රාග්ධන ප්‍රදාන ලෙස රු.6,275,322 ක් ලබා දීම සඳහා ව්‍යාපෘති 02 ක් ක්‍රියාත්මක කර තිබුණ අතර විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ සටහන් අංක 10 යටතේ සහ වත්කම් සහ වගකීම් ප්‍රකාශයේ ශුද්ධ වත්කම්/ ස්කන්ධය යටතේ එම ප්‍රාග්ධන ප්‍රදාන දක්වා නොතිබුණි. | -එම- | ප්‍රාග්ධන ප්‍රදාන නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඒ) | ඉකුත් වර්ෂයේ රු.7,633,946 ක ප්‍රාග්ධන ප්‍රදාන වටිනාකමින් සියයට 10 ක ප්‍රමාණය එනම් රු.763,394 ක් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ අයභාරය යටතේ දැක්විය යුතු වුවත් එය රු.2,235,958 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති බැවින් වර්ෂයේ අතිරික්තය රු.1,472,564 කින් වැඩියෙන් දක්වා තිබුණි. | -එම- | ප්‍රාග්ධන ප්‍රදානයන්ට අදාළ වටිනාකම නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ඹ) | ඉකුත් වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදාන වටිනාකමින් සටහන් අංක 5 යටතේ ගිණුම්ගත කළ යුතු ක්‍රමක්ෂය වටිනාකම ගැලපීමෙන් පසු ඉතිරි වටිනාකම රු.6,870,552 ක් සහ සමාලෝචිත වර්ෂයේදී ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන රු.6,275,322 ක් වශයෙන් එකතුව රු.13,145,874 ක් ලෙස වත්කම් හා වගකීම් ප්‍රකාශයේ ශුද්ධ වත්කම් යටතේ හඳුනා නොගත් ප්‍රාග්ධන ප්‍රදාන ලෙස දක්වා නොතිබුණි. | -එම- | සමාලෝචිත වර්ෂය අවසානයට පවතින ප්‍රාග්ධන ප්‍රදාන වටිනාකම නිවැරදිව ගණනය කර ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඕ) | කොරෝනා රෝගී තත්ත්වය යටතේ මියගිය අයගේ මෘතදේහ නොමිලේ ආදාහනය කිරීම වෙනුවෙන් සභාව විසින් දරන ලද වියදම ප්‍රතිපූර්ණය කිරීම සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් රු.4,745,520 ක් ලැබී තිබුණ ද මෙම මුදල විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ අයභාරය යටතේ දක්වා නොතිබුණි. මේ නිසා එම වටිනාකමින් වර්ෂයේ අතිරික්තය අඩුවෙන් නිරූපනය වේ. | රු.4,745,520 ක මුදල තැන්පත් ගිණුමට හර කර 2.9.431(iii) හා 2.9.434 යන වැය ශිර්ෂ වලට බැර කර ඇත. එය විස්තීරණ ආදායම් යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. | ලැබෙන ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ක) | පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් සේවක වැටුප් ලෙස රු.782,696,000 ක් ප්‍රතිපූර්ණය කර තිබුණ ද විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ අයභාරය යටතේ රු.745,642,175 ක් ලෙස දැක්විම නිසා රු.37,053,825 කින් ආදායම අඩුවෙන් දක්වා තිබුණි. | වැටුප් ප්‍රතිපූර්ණයට ආදාළව ගළපන ලද ජර්නල් සටහන් අනුව ශේෂය රු.745,642,175 ක් ලෙස ගණනය කර ඇති අතර මෙය නැවත සොයා බලා 2022 වර්ෂයේ නිවැරදි කර ගිණුම් තබන බව දන්වා සිටිමි. | ප්‍රතිපූර්ණය කරන ලද වටිනාකම නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ග) | රු.2,449,030 ක් වටිනා ආයුර්වේද බෙහෙත් තොගය, තොගය යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | රු.2,449,030 ක් වටිනා ආයුර්වේද තොගය අතපසුවීමක් ගිණුම් නොතබා ඇති අතර එය 2022 වර්ෂයේදී මහහැරිම් යටතේ ගිණුම් තබන බව දන්වා සිටිමි. | තොගය නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ඖ) | පලාත් සභා හා විමධ්‍යගත ව්‍යාපෘති ණයගැති වටිනාකම රු.7,484,457 ක් වුවද එය මූල්‍ය ප්‍රකාශනවල රු.10,031,968 ක් ලෙස දැක්වීම නිසා වත්කම් රු.2,547,511 ක් වැඩියෙන් ගිණුම්වල දක්වා තිබුණි. | ගණනය කිරීමේදී ඇති වූ වරදකින් මෙය ගිණුම් වල රු.10,031,968 ක් ගෙන දක්වා ඇති එය නැවත සොයා බලා 2022 වර්ෂයේ නිවැරදි කර ගිණුම් තබන බව දන්වා සිටිමි. | ව්‍යාපෘති ණයගැති වටිනාකම නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |

**1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 10 කට අදාළ ශේෂයන් ඒවාට අදාළ උපයෝගී ලේඛන/ වාර්තාවල දැක්වෙන ශේෂයන් සමඟ සැසදීමේදී මූල්‍ය ප්‍රකාශනවල රු.4,188,983 ක් අඩුවෙන් හා රු.20,446,435 ක් වැඩියෙන් දක්වා තිබුණි. | අදහස් දක්වා නොමැත. | වෙනස්කම් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව 1,114,684,584 ක් වූ ගිණුම් විෂයයන් 07 ක් සඳහා ගිවිසුම් ශේෂ සනාථ කිරීම් සහ උපලේඛන යනාදී සාක්ෂි ඉදිරිපත් නොවීම හේතුවෙන් විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සත්‍යාපනය කළ නොහැකි විය. | 2022 අවසන් ගිණුම පිළියෙළ කිරීමේදී මෙම වාර්තා සහ උපලේඛණ ලබා දෙන බව කාරුණිකව දන්වමි. | ශේෂ තහවුරුව සඳහා අවශ්‍ය සාක්ෂි නොපමාව සැපයිය යුතුවේ. |

**1.7** **අනුකූල නොවීම්**

**--------------------**

1.7.1 **නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

**--------------------------------------------------------------------------------**

නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | **නීති රීති, රෙගුලාසි ආදියට යොමුව**<br>------------------------------ | **අනුකූල නොවීම**<br>-------------------- | **සභාවේ අදහස් දැක්වීම**<br>---------------------- | **නිර්දේශය**<br>------------ |
|---|---|---|---|---|
| | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>---------------------- | | | |
| (අ) | මුදල් රෙගුලාසි 104(1) හා (3) | යම්කිසි හානියක් සම්බන්ධයෙන් පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට දින හතකට වඩා ප්‍රමාද වේ නම් ප්‍රාරම්භක වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවත් 2019 නොවැම්බර් මස සිදු කර තිබූ වරිපනම් බදු මුල්‍ය අක්‍රමිකතාව සම්බන්ධයෙන් සභාව එසේ කටයුතු කර නොතිබුණි. | මෙම මූල්‍ය වංචාව සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණයක් සිදු කරමින් පවතින අතර 2022 ජූනි මස ඊළඟ සැසි වාරය නියමිතය. මෙම විනය පරීක්ෂණය අවසන් වූ වහාම අදාළ සියලුම වාර්තා ඉදිරිපත් කරන බව කාරුණිකව දන්වමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ප්‍රාරම්භක සහ අවසාන වාර්තා නොපමාව ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | මුදල් රෙගුලාසි 486(ආ) සහ (2) | 2002 සිට 2021 දක්වා කාලපරිච්ඡේදය තුළ සභාවට ලබාදී තිබූ චෙක්පත් 23 ක් අගරු වී තිබුණද මෙම චෙක්පත් සඳහා මුදල් ආපසු අයකර ගැනීමට හෝ අදාළ ණයගැති ගිණුම හර කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. | මෙම අඟරු චෙක්පත් 23 න් චෙක්පත් 02 ක මුදල වන රු.32,250 ක් 2022 වර්ෂයේ අයකර ගෙන ඇත. ඉතිරි චෙක්පත් වලින් රු.30,000 ක මුදල වරිපනම් සඳහා කරන ලද ගෙවීම් බැවින් එම ගිණුම් හර කර ජර්නල් සටහන් යොදන බව දන්වමි. මෙයින් කඩ කුලී සඳහා ගෙවන ලද රු.100,000 බැගින් වූ චෙක්පත් 03 ක් නීතිමය පියවර ගැනීමට නීති නිලධාරීන්ට යොමු කර ඇත. ඉතිරි අඟරු චෙක්පත් අය කර ගැනීමට ඉදිරියේ දී කටයුතු කරන බව දන්වමි. | අඟරු චෙක්පත් සඳහා මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | මුදල් රෙගුලාසි 880 හා රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතේ 612 වැනි අධිකාරිය | ඇප තැබිය යුතු රජයේ නිලධාරීන් ඇප තැබිය යුතු වුවත් මහා නගර සභාවේ ආදායම් එකතු කිරීමේ නිලධාරීන්, ආදායම් මුද්දර හෝ බඩු බාහිරාදිය භාරව සිටින පරිපාලනමය වශයෙන් වගකිවයුතු හෝ බලය පැවරීම යටතේ කටයුතු කරන නිලධාරීන් වවුචර් සහතික කරන, චෙක්පත් අත්සන් කරන නිලධාරීන් එසේ ඇප තබා නොතිබුණි. | මේ සම්බන්ධයෙන් අදාළ කටයුතු ඉදිරියේ දී කිරීමට නියමිතය. | ඇප තැබිය යුතු රජයේ නිලධාරීන්ගෙන් නොපමාව ඇප මුදල් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.136,192,585 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.24,003,920 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

2.2.1 **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් | | |
| (i) | සමාලෝචිත වර්ෂය සඳහා බිල් කරන ලද වරිපනම් බදු ආදායම රු.387,751,686 ක් වුවද ඉන් රු.130,730,105 ක් හෙවත් සියයට 35 ක් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. එසේම පසුගිය වර්ෂයේ හිඟ වරිපනම් ශේෂය රු.430,797,789 ක් වුවද ඉන් රු.348,306,737 ක් හෙවත් සියයට 81 ක් අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | කොරෝනා වසංගතය වර්ධනය වීම හේතුවෙන් 2021 වර්ෂයේ බිල්කළ ආදායමත් 2021.12.31 දිනට හිඟ වරිපනම් මුදලත් එකතු කර ගැනීමට අපහසු විය. නමුත් 2022.04.30 දින වන විට 2020.12.31 දිනට හිඟ වරිපනම් ශේෂයෙන් සහ 2021.12.31 දිනට හිඟ වරිපනම් ශේෂයක් යන දෙකේම එකතුවෙන් රු.56,812,222 ක් ප්‍රමාණයක් 2022.04.30 දින වන විට අයකර ගෙන ඇත. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ii) | වරිපනම් බදු ගෙවීම සඳහා ලබා දී තිබූ වටිනාකම රු.792,430 ක් වූ චෙක්පත් 10 ක් අගරු වී තිබූ අතර ඒ සඳහා නැවත මුදල් ලබා ගැනීමෙන් තොරව වරිපනම් ගිණුම හර කර තිබුණි. | දේපළ වල හිමිකරුවන් වෙත නැවත මුදල් ගෙවන ලෙසට ලිඛිතව දැනුවත් කරමින් අදාළ වරිපනම් ගිණුම් වල ගෙවිය යුතු මුදලක් ලෙස සටහන් කර ඇත. ඉදිරියේ දී එම මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | අගරු චෙක්පත් සඳහා නැවත මුදල් ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (iii) | 2021 දෙසැම්බර් 31 දිනට වරිපනම් බදු අයකළ හැකි දේපළ 86000 ක් පමණ පැවති අතර ඉන් දේපළ 43030 ක රු.483,881,071 ක වරිපනම් හිඟයක් පැවතුණි. මෙම හිඟය තුළ රු.100,000 ට වැඩි වටිනාකමකින් යුත් වරිපනම් ඒකක 654 කින් රු.207,733,077 ක් අයවීමට තිබුණි. | අයකර ගැනීමට තිබූ රු.216,162,755 ක මුදලින් රු.8,429,678 ක් 2022.04.30 දින වන විට අයකර ගෙන ඇත. රටේ පැවති සහ වර්තමානයේ රටේ පවතින අයහපත් වාතාවරණය මෙම හිඟ මුදල එකතු කිරීමේදී සෑම විටම බලපා ඇත. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (iv) | සම්ප්‍රේෂණ කුළුණු පවතින දේපළ 34 කින් 2021 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ වරිපනම් හා සම්ප්‍රේෂණ කුළුණු ආදායම රු.6,454,787 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සම්ප්‍රේෂණ කුළුණු සමඟ පවතින දේපළ වල හිඟ ආදායම් අය කිරීම සඳහා දේපළ හිමිකරුවන්ට ලිඛිතව මෙන්ම දුරකථන පණිවුඩ මඟින් ද දැනුවත් කර ඇති අතර, ඉදිරියේ දී මෙම හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කරමින් පවතී. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) | කසළ බදු<br>---------- | | |
| | සභාව විසින් කසළ ඉවත්කරනු ලබන ව්‍යාපාරික ස්ථාන සමඟ ගිවිසුම්ගත වී නොමැති බැවින් හිඟ කසළ බදු අයකිරීමේදී නීත්‍යානුකූලව කටයුතු කිරීමට නොහැකි වී තිබුණි. එසේම, 2003 නොවැම්බර් 18 දිනැති අංක 08(10)35 දරන සභා තීරණය හා මුදල් කාරක සභාවේ උපදෙස් පරිදි හිඟ කසළ බදු අයකිරීමට කටයුතු නොකිරීම නිසා 2021 දෙසැම්බර් 31 දිනට හිඟ කසළ බදු ආදායම රු.12,249,**021** ක් පැවතුණි. | සංශෝධිත කසළ ඉවත් කිරීමේ අයදුම්පත අලුතින් ලියාපදිංචි කිරීමේ ආයතන සඳහා භාවිතා කරනු ලබයි. මෙම සංශෝධිත අයදුම්පත්‍රයේ සඳහන් ලෝඩ් ප්‍රමාණයට අදාළව නියමිත කසළ ගාස්තු ගෙවන ලෙසත් එසේ ගෙවීම් පැහැර හැරයහොත් මහා නගර සභා ආඥා පනත අනුව නිතීමය පියවර ගන්නා බවත් සඳහන් කරමින් නියෝග ලබා දී ඇත. ඒ අනුව ඉදිරියේදී නව අයදුම්පත්‍රය යටතේ ලියාපදිංචි කරන නව ආයතන වල හිඟ ගාස්තු අය කිරීමට අදාළ කටයුතු සිදු කරනු ලබයි. 2021.12.31 දිනට හිඟ කසළ බදු ආදායමෙන් 2022.05.19 දින වන විට රු.4,956,677ක ආදායමක් නගර සභාව වෙත කෝවිඩ් වසංගතය පැවති අවස්ථාවේදී පවා අයකර ගැනීමට කටයුතු කර ඇත. ඉතිරි හිඟ | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| | | කසළ ගාස්තු ආදායම අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | |
| (ඇ) | වෙනත් බදු<br>------------ | | |
| | 2021 දෙසැම්බර් 31 දිනට හිඟ කේබල් ටී.වී. ආදායම රු.4,718,601 ක් හා දැන්වීම් පුවරු හිඟ ශේෂය රු.13,918,749 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලංකා බ්‍රෝඩ්බෑන්ඩ් ආයතනය සතු වලංගු බලපත්‍රය 2016.12.22 දින සිට අවලංගු වී ඇති බවත් එම ආයතනය සතුව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති වලංගු බලපත්‍රය නොමැත. සභාවේ නීති නිලධාරීන් විසින් ගෙවීම් පැහැර හැරීම සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගැනීමේ දී දැන ගැනීමට ලැබී ඇත. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ඈ) | කඩකුලී<br>--------- | | |
| (i) | 2020 දෙසැම්බර් 31 දිනට පැවති හිඟ කුලි ශේෂය වූ රු.7,351,211 කින් රු.4,660,191 ක් හෙවත් සියයට 63 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. එසේම සමාලෝචිත වර්ෂයේ බිල් කළ ආදායම රු.14,722,000 ක් වුවද ඉන් රු.6,295,271 ක් හෙවත් සියයට 43 ක් සමාලෝචිත වර්ෂය තුළ අයකර ගෙන නොතිබුණි. | රටේ පැවති සහ පවතින අයහපත් තත්වය හේතුවෙන් බදුකරුවන්ට ක්‍රමානුකූලව ගෙවීම් කිරීමට අපහසු විය. මෙම හිඟයෙන් 2022.05.29 දින වන විට රු.4,284,486 ක් අය කර ගෙන ඇති බව කාරුණිකව දන්වමි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ii) | කඩකුලී ගිවිසුමෙහි 19 වන වගන්තිය ප්‍රකාරව නියමිත දිනට කුලි නොගෙවා නොකඩවා මාස 03 ක කාලයක් කුලී නොගෙවන්නේ නම් බදු ගිවිසුම අවලංගු කර බදුකරු එම ස්ථානයෙන් නෙරපා දැමීමට ද හිඟකුලී ඇතුළු සභාවට දැරීමට වන සෑම අලාභයක් හා පාඩුවක්ම බදුකරුගෙන් නීත්‍යානුකූලව අය කිරීමට ද කටයුතු කළ යුතු වුවත් කුලී අයවීම් හිඟහිටි කඩ කාමර 128 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | පෙර සිදු වී ඇති අතපසුවීම් නිවැරදි කර ගනිමින් ඉදිරියට මෙවැනි අඩුපාඩු සිදු නොවීමටත් වග බලා ගන්නා අතර අයවිය යුතු හිඟ මුදල් අය කර ගනිමින් පවතින අතර නැවත ගිවිසුම්ගත කිරීමට ක්‍රියා කරමින් පවතී. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (iii) | දීර්ඝ කාලයක සිට හිඟ කුලීයක් පැවති කඩ කාමර 27 ක් මුද්‍රා තබා තිබූ අතර එම කඩ කාමර වලින් අයවිය යුතු හිඟ කුලීය රු.1,644,177 කි. | නීති නිලධාරින්ගේ උපදෙස් අනුව හිඟ මුදල් අය කිරීමට නියමිතය. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ඉ) | දේපල කුලී (බදුකර)<br>----------------------- | | |
| | 2021 දෙසැම්බර් 31 දිනට දේපල 17 කින් අයවිය යුතු හිඟ දේපළ කුලිය රු.6,516,799 ක් සමාලෝචිත වර්ෂය තුළදී ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම හිඟයෙන් 2022.05.29 දින වන විට රු.519,739 ක් අයකර ගෙන ඇත. පවතින ගැටළු නිරාකරණය කර ගනිමින් හිඟ දේපළ කුලීය අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. | හිඟ ආදායම් අයකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුවේ. |
| (ඊ) | බලපත්‍ර ගාස්තු<br>---------------- | | |
| (i) | 2021 වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර නිකුත් කළයුතු වෙළඳසැල් 1887 ක් පවතින බව දක්වා තිබුණද වෙළඳසැල් 889 ක් බලපත්‍ර ලබා නොගෙන එනම් බලපත්‍ර ගාස්තු ගෙවීමෙන් තොරව ව්‍යාපාර කටයුතු සිදුකර තිබුණි. තවද 2021 වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර ඉල්ලුම් කළ ව්‍යාපාරික ස්ථාන 20 ක් මුදල් ගෙවා බලපත්ර ලබාගෙන නොතිබූ බැවින් සභාවට ලැබිය යුතු බලපත්‍ර ගාස්තු ආදායම අහිමි වී තිබුණි. | මෙම සංඛ්‍යාවෙන් වෙළඳසැල් 401 ක් බලපත්‍ර ලබා ගෙන ඇත. එහි වටිනාකම රු.3,3465,857කි. 2022.05.27 දින වන විට තවත් වෙළඳසැල් 167 ක් බලපත්‍ර ලබා ගෙන ඇති අතර එහි වටිනාකම රු.1,152,954 කි. 2022.06.30 න් පසුව වෙළඳ බලපත්‍ර නිකුත් කිරීමක් සිදු නොවන අතර ඉදිරියේ දී වෙළඳ බලපත්‍ර නොගෙන ඇති වෙළඳසැල් සඳහා නිතීමය කටයුතු කිරීමට බලාපොරොත්තු වේ. | වාර්ෂික වෙළඳ බලපත්‍ර ආදායම ලබා ගැනීමට කටයුතු කළ යුතු අතර බලපත්‍ර ලබා නොගන්නා ව්‍යාපාර සඳහා නඩු පැවරීමට කටයුතු කළ යුතුවේ. |
| (ii) | 2021 දෙසැම්බර් 31 දිනට හිඟ කර්මාන්ත හා ව්‍යාපාර බදු ශේෂය රු.95,006,513 ක් හා වෙළඳ බලපත්‍ර හිඟ ශේෂය රු.5,424,142 ක මුදල සමාලෝචිත වර්ෂය තුළදී අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | 2021 වර්ෂයේ බදු සහ වෙළඳ බලපත්‍ර නොගෙවූ ව්‍යාපාරිකයන් සඳහා නීතීමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතී. | හිඟ ආදායම් අයකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුවේ. |

(උ) උසාවි දඩ

-----------

| | | | |
|---|---|---|---|
| (i) | 2017 වර්ෂයේ සිට 2021 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදයට අදාළව අධිකරණ මඟින් අය කරගන්නා ලද උසාවි දඩ මුදල් වටිනාකම ලෙස රු.58,081,925 ක් දක්වා තිබුණද සමාලෝචිත වර්ෂය තුළදීද සභාව වෙත එම මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2017 නොවැම්බර් මස දක්වා උසාවි දඩ වශයෙන් රු.5,516,750 ක් මේ වන විට ලැබී ඇත. 2017 ඔක්තෝම්බර් සිට 2018 දෙසැම්බර් දක්වා උසාවි දඩ උප පත්‍රිකා සකස් කොට පරික්ෂා කිරීම සඳහා ගල්කිස්ස අධිකරණ කාර්යාලයට භාර දී ඇත. 2019 ජනවාරි සිට දෙසැම්බර් දක්වා උසාවි දඩ ලියා නිම කර ඇත. උප පත්‍රිකා සකස් කරමින් පවතී. | උසාවි දඩ ආදායම අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ii) | 1994 අංක 04 දරන උසාවි දඩ මුදල් හා දඩ පැවරීමේ ප්‍රඥප්තියේ විධිවිධාන පරිදි උසාවි දඩ අයකරනු ලැබූ වර්ෂයේ දෙසැම්බර් 31 දින සිට වර්ෂ 5 ක් ඇතුළත එම දඩ මුදල් අයකරනු ලැබූ අධිකරණයේ රෙජිස්ට්‍රාර් විසින් හෝ ඔහු විසින් නම් කරනු ලැබූ නිලධාරියෙකු විසින් සහතික කරන ලද ලේඛන සහිතව ඉල්ලීම් ඉදිරිපත් කර සභාවට ලැබිය යුතු උසාවි දඩ මුදල් ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. එහෙත් 2016 වර්ෂයට පෙර ලැබිය යුතු දඩ ආදායම් රු.38,058,207 ක් අයකර ගැනීමේ කාලය ඉහත ප්‍රඥප්තිය අනුව ඉකුත් වී ඇති බැවින් එම වටිනාකම සමුච්චිත අරමුදලට හර කරමින් ගිණුම්වලින් ඉවත් කර තිබුණි. | 2016 වර්ෂයේ උසාවි දඩ එකතු කිරීම අක්‍රමවත් වී තිබුණත් මේ වන විට එම වරද නිවැරදි කර ක්‍රමවත්ව උසාවි දඩ එකතු කිරීමේ කටයුත්ත සිදු වෙමින් පවතී. | උසාවි දඩ ආදායම් වාර්ෂිකව අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (iii) | සමාලෝචිත වර්ෂය තුලදි උසාවි දඩ මුදල් ලෙස සභාවට කිසිදු ආදායමක් ලැබී නොතිබුණ අතර විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ උසාවි දඩ ආදායම් ලෙස රු.12,000,000 ක ඇස්තමේන්තුගත අගයක් දක්වා තිබුණි. මේ නිසා සෑම වර්ෂයකම එම ප්‍රමාණයෙන් වසරේ අතිරික්තය වැඩි වීමට හේතු වී තිබුණි. | 2017 ඔක්තෝම්බර් මස සිට සහ 2018 වර්ෂයට අදාළ උසාවි දඩ උප පත්‍රිකා සකස් කර පරික්ෂා කිරීම සඳහා ගල්කිස්ස අධිකරණ කාර්යාලයට භාර දී ඇති අතර, 2019 උසාවි දඩ ලියා අවසන් කොට උප පත්‍රිකා සකස් කරමින් පවතී. | ලැබිය යුතු ආදායම් නොපමාව ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. මු.රෙ. 156 කෙරෙහි අවධානය යොමු කරවමි. |

2.2 අධිභාර

-------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මහා නගර සභා ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව විගණකාධිපතිවරයා විසින් 1974 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලය තුළදී පැනවූ අධිභාර වෙනුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට රු.3,563,042 ක් අයකර ගැනීමට තිබුණි. | ලිපිගොනු නිති අංශය වෙත යොමු කර ඇත. | අධිභාර ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

**3 මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1 හඳුනාගත් පාඩු**

-----------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2011 නොවැම්බර් 11 දින සිට 2016 අප්‍රේල් දක්වා සේවය අත්හිටවූ සේවකයකු වෙනුවෙන් රු.1,413,903 ක වැටුප් හා දීමනා ගෙවා තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම මුදල් ආපසු අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | මූලික විමර්ශනයක් සිදුකර චූදිත නිලධාරීන් හඳුනාගෙන ඇති අතර විධිමත් විනය පරික්ෂණයක් පැවැත්වීම සඳහා චෝදනා පත්‍ර කෙටුම්පත් ද සමඟ මූලික විමර්ශන ගොණුව පළාත් පාලන කොමසාරිස් (බ.ප) වෙත යොමු කර ඇත. | මුදල් ආපසු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) | 2019 නොවැම්බර් 18 දින සිදු කරන ලද රු.145,470 ක වරිපනම් බදු මූල්‍යමය වංචාව සම්බන්ධයෙන් අලාභය අයකර ගැනීමට හා විනය ක්‍රියාමාර්ග ගැනීමේ කටයුතු නිම කර නොතිබුණි. | මෙම මූල්‍ය වංචාව සම්බන්ධයෙන් විධිමත් විනය පරික්ෂණය මේවන විට සිදු කරමින් පවතින අතර 2022 ජුනි මස ඊළඟ සැසි වාරය රැස්වීමට නියමිතය. | විනය පරික්ෂණය පවත්වා අලාභය අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

------------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| තොරතුරු දැන ගැනීමේ පනත<br>-----------------------------<br>මහජනයා විසින් ඉල්ලන ලද තොරතුරු වාර්තා කිරීම සඳහා ප්‍රධාන තොරතුරු ලේඛනයක් පවත්වා ගෙනගොස් නොතිබුණි. එබැවින් තොරතුරු ඉල්ලීම් අස්ථානගත වීම්, පිළිතුරු ලබා | තොරතුරු විමසීමකදී එය ප්‍රථමයෙන්ම නාගරික කොමසාරිස් වෙත යොමු වන අතර ඉන් අනතුරුව නියෝජ්‍ය නාගරික කොමසාරිස් වෙත යොමු කරනු ලැබේ. එහි දී අදාළ | ගොනුවට අමතර ප්‍රධාන තොරතුරු ලේඛනයක සියළුම තොරතුරු කැඳවීම් ලිපි ලේඛණගත කළ යුතුවේ. |

| | | |
|---|---|---|
| නොදීම හා ප්‍රතික්ෂේප කිරීම් වැනි තත්ත්වයන් පිළිබඳව පරික්ෂා කළ නොහැකි විය. | දෙපාර්තමේන්තුවෙන් පිළිතුරු සකසා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සනින් පිළිතුරු ලිපියේ පිටපතක් පසු විපරම් සඳහා නියෝජ්‍ය නාගරික කොමසාරිස් වෙත එවනු ලැබේ. නියෝජ්‍ය නාගරික කොමසාරිස් යටතේ මෙම ප්‍රධාන ගොනුව පවත්වා ගෙන යනු ලැබේ. | |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

--------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වීදි පහන් සවි කිරීම හා නඩත්තුව** | | |
| සභා බල ප්‍රදේශයේ පිහිටා ඇති වීදි පහන් කණු හඳුනා ගැනීමට අංකගත කිරීමේ ක්‍රමවේදයක් සහිත වීදි පහන් ලේඛනයක් සභාව විසින් නඩත්තු කර නොතිබූ බැවින් එක් එක් වීදි පහන් කණුව සඳහා සභාව වාර්ෂිකව කොපමණ මුදලක් වැය කරන්නේද යන්න හා කොපමණ කාලයකට වරක් බල්බ් හා අනෙකුත් උපාංග සවි කරන්නේද යන්න තහවුරු කර ගත නොහැකි විය. | නගර සභා බල ප්‍රදේශය තුළ වීථි පහන් කණු අංක කර සංඛ්‍යා ලේඛණයක් සකස් කිරීම සඳහා සභාවේ කොට්ඨාශ මට්ටමින් තාක්ෂණ නිලධාරීන් නොමැති බැවින් සභා තීරණයක් මත පුද්ගලික අංශයෙන් මෙම කාර්ය ඉටු කර ගැනීම සඳහා මිල ගණන් කැඳවන ලදි. ඇභයිම් කමිටු වාර්තා සභාගත කිරීමේදී අවම මිල අනුව ද රු.10,900,000 ක අමතර පිරිවැයක් දැරීමට සිදු වන බැවින් එය ඉටු කිරීම ප්‍රතික්ෂේප විය. | විදි පහන් කණු හඳුනා ගැනීමට අංකගත කිරීමට ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ යුතුවේ. |
| **(ආ) වෙළඳ ස්ථාන කුලී** | | |
| කුලී හිඟව පැවති සභාව සතු කඩ කාමර බදු දී තිබුණද බදුකරුවන් සමඟ ගිවිසුම්වලට එළඹ නොතිබුණි. එමෙන්ම ඇතැම් ගිවිසුම්වල ගිවිසුම්ගත කාලය ඉක්ම ගොස් තිබුණද නැවත ගිවිසුම් අලුත් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගිවිසුම් වල තිබෙන අඩුපාඩුකම් යාවත්කාලීන කරමින් ගිවිසුම් ගත වී නැති බදුකරුවන් සමඟ ගිවිසුම් ගත වීමේ කටයුතු වල නිරත වෙමින් පවතී. | බදුදීමේදී ගිවිසුම් වලට එළඹීමට හා ගිවිසුම්ගත කාලය ඉක්මවූ ගිවිසුම් නැවත අළුත් කිරීමට කටයුතු කළ යුතුවේ. |

## 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දීර්ඝ කාලයක සිට වසා දමා හා මුද්‍රා තබා තිබූ කඩකාමර 27 ක් නැවත පවරා ගෙන වෙනත් බදුකරුවන් වෙත බදු දී ආදායම් ඉපයීමට කටයුතු කර නොතිබුණි. | ටෙන්ඩර් කිරීමට නොහැකි වී ඇත්තේ මෙම දෙහිවල මධ්‍යම වෙළඳසැල ඉවත්කර නව වෙළඳසැලක් ඉදිකිරීමට යෝජිත බැවිනි. 2022 ජුනි මස 23 දින මුදල් කමිටුවේ දී මේ පිළිබඳ තිරණයක් ගැනීමට බලාපොරොත්තු වේ. | කඩ කාමර බදුදී ආදායම් ඉපැයීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) | රු.25,751,793 ක වියදමක් දරා දෙහිවල මංසන්ධියේ ඉදිකර තිබූ කඩකාමර 25 ක් බදුකරුවන් වෙත ලබා දී සමාලෝචිත වර්ෂයේ කුලී අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | දෙහිවල ගාලුපාර නව වෙළඳ සංකීර්ණ ඉදිකර කුලී කඩ 10 ක් දෙහිවල දිනපතා පොළෙහි අඛණ්ඩ කුලී ගෙවන ලද පැරණි බදුකරුවන් 10 දෙනෙකුට පිරිනමා ඇත. නමුත් මෙම බදුකරුවන් පසුව සභා තක්සේරුවට එකඟ නොවීමත් මෙහි බදුදීමේ අයිතියට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය අවශ්‍ය වීමත්, යන හේතූන් දෙක මත ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යවන ලදී. එහි අඩුපාඩු ලෙස මෙම වෙළඳ සංකීර්ණ අයත් ඔප්පු පිටපතක් ඉල්ලා ඇත. ඒ සඳහා මේ වන විට ඔප්පුවක් සකස් කරමින් පවතී. ( නීති අංශය මඟින්) මෙහි විදුලිය සහ ජල පහසුකම් නොමැති වීම නිසා බදුකරුවන් කුලී ගෙවීම පැහැර හරින ලදී. නමුත් විදුලි පහසුකම් මේ වන විට සපයා ඇති අතර ජල පහසුකම් ලබා දීමේ කටයුතු සිදු කරමින් පවතී. ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබූ විගස ඉතිරි කඩ සඳහා ප්‍රතිසම්පාදන කටයුතු කිරීමට අවශ්‍ය ලියකිවිලි සකසා ඇත. | කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

3.5 **වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි දේපළ 73 න් දේපළ 34 ක අයිතිය තහවුරු කිරීම පිළිබඳව අවශ්‍ය ඔප්පු හෝ පවරා ගැනීමේ නියෝග නොතිබූ අතර ඉඩමේ ප්‍රමාණය (වපසරිය) මැණුම් කර නොතිබූ දේපළ ප්‍රමාණය 24 ක් විය. | සියළුම ඉඩම් මැණුම් කර හිමිකම් සහතික ලබා ගැනීමට නියමිතය. | ඉඩම් මැණුම් කර හිමිකම් සහතික ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | සභාව සතු ඉඩම් පිළිබඳව වාර්ෂික වත්කම් සත්‍යාපනයක් දීර්ඝ කාලයක සිට සිදුකර නොතිබූ අතර ඉඩම් පිළිබඳ නිසි අධීක්ෂණයක් හා ආරක්ෂිත පියවරයන් අනුගමනය නොකිරීම නිසා සභාව සතු ඉඩම් වෙනත් පුද්ගලයන් විසින් අනවසරයෙන් අත්පත් කර ගත් අවස්ථා 5 ක් පැවතුණි. | ක්‍රියාකාරී සැළැස්ම යටතේ ඉඩම් හඳුනාගෙන එහි ආරක්ෂක වැටක් ඉදිකර සභාව සතු බවට නාම පුවරුවක් සවි කිරීමට නියමිතය. බිම් සවිය මඟින් මැණුම් කටයුතු සිදුකර අවසන් සභාව සතු බිම් කැබලි සඳහා හිමිකම් සහතික ලබා ගැනීමටද බලාපොරොත්තු වේ. | අනවසර අත්පත් කර ගැනීම් සම්බන්ධ අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගැනීමට කටයුතු කළ යුතුය. |
| (iii) | සභාව සතු රූඩ් 01 පර්චස් 4.19 ක් විශාල වූ ගල්කිස්ස වත්ත ඉඩමේ පොදු වැසිකිලි, රත්මලාන ප්‍රාදේශීය ලේකම් විසින් බදු දී ඇති බව දක්වා තිබුණද එම ඉඩමේ පොදු වැසිකිලි නොතිබූ අතර ඉඩම බදු දීමෙන් සභාවට කිසිදු ආදායමක් ලැබී නොතිබුණි. එමෙන්ම බාහිර පාර්ශවයක් විසින් මෙම ඉඩම අනවසරයෙන් භුක්ති විඳින බව නිරීක්ෂණය විය. | සභාව සතුව පවතින දේපළ ලේඛණයේ ගල්කිස්සවත්ත පොදු වැසිකිළි සහිත ඉඩම වශයෙන් සඳහන් ඉඩමක් (රූ1 පර් 4) සඳහන් වේ. එහි ඔප්පු අංකය වශයෙන් 393292 සඳහන් ඇත. අනවසර ඉදිකිරීම් ඇති සභාව සතු සියළු ඉඩම් සඳහා ඒ සම්බන්ධව විධිමත් ආකාරයට (සියළු අනවසර ඉදිකිරීම් සඳහා) කටයුතු කිරීමට සභාව තීරණය කර ඇත. | අනවසර අත්පත් කර ගැනීම් සම්බන්ධ අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගැනීමට කටයුතු කළ යුතුය. |
| (iv) | ගල්කිස්ස හෝටල් පාරේ අංක 4/89 දරන බිම් සැලැස්මේ රූඩ් 01 පර්චස් 4.10 ක් වූ ඉඩම වාහන නැවතුම් පොලක් ලෙස භාවිතා කිරීම සඳහා වර්ෂ 30 කාලයක් සඳහා 1991 ජුනි 01 දින ගල්කිස්ස හෝටලය වෙත බදු දී තිබුණි.<br>නගර සභාව සතු මෙම දේපල බදුදීමේදී ගිවිසුම්වල පවත්නා අඩුපාඩු හේතුකොට ගෙන 2021 දෙසැම්බර් 31 | ගල්කිස්ස හෝටලයේ රථ ගාල සඳහා සභාව සතු පර්චස් 25 පමණක් බදු වශයෙන් වසර 30 ට ලබා දී ඇති අතර 2021 වර්ෂයේ මෙම බදු කාලය අවසන් වී ඇත. ඉඩමේ මැණුම් කටයුතු සිදුකර නැවත බදුදීම සඳහා බදු ගිවිසුම් සකස් වෙමින් පවතී. | අයවිය යුතු මුදල් කඩනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

දින වන විට මෙම දේපලේ හිඟකුලිය රු.4,768,561 ක් වුවද එම කුලී මුදල් බදුකරුගෙන් අයකර ගැනීමට නොහැකි වී තිබුණු අතර ගිවිසුම්ගත කාලයද 2021 මැයි 31 දිනෙන් අවසන් වී තිබුණි.

**3.6 ව්‍යාපෘති, කර්තව්‍යන් හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ප්‍රේෂර් ක්‍රීඩාංගනයේ ගෘහස්ථ ක්‍රීඩාගාරය ඉදිකිරීම සඳහා රු.50,000,000 ක වියදමක් 2018 මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද 2021 දෙසැම්බර් 31 දින වන විටත් මෙම කාර්ය නිම කර නොතිබුණි. 2014 මාර්තු 25 දින ආරම්භ කරන ලද දෙහිවල මහජන ක්‍රීඩාංගනය හා ක්‍රීඩා සංකීර්ණය ඉදිකිරීමේ කටයුතු වර්ෂ 6 ක් ඉක්ම වුවද නිමකිරීමට නොහැකි වී තිබුණි. | ප්‍රේසර් ක්‍රීඩාංගනයේ ගෘහස්ථ ක්‍රීඩාගාරය ඉදි කිරීමේ ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය උපදේශන ආයතනය ලෙස තෝරා ගෙන 2019.10.18 ටෙන්ඩර් කරන ලදි. එම ඉදිරිපත් වූ ආයතනය මෙම ව්‍යාපෘතිය සිදු කිරීමට ප්‍රමාණවත් සුදුසුකම් සපුරා නොතිබු බැවින් උපදේශන ආයතනයේ නිර්දේශ මත නැවත 2022.06.26 ටෙන්ඩර් කැඳවා කොන්ත්‍රාත් ආයතනය තෝරා ගෙන එම කර්මාන්තය මේ වන විට ආරම්භ කර ඇත. ව්‍යාපෘතිය ගිවිසුම් ප්‍රකාරව 2022.10.03 දිනට නිම වීමට නියමිත වේ. | වැඩ නිම කිරීම ප්‍රමාදව කළ යුතුය. |
| (ආ) | වනරතන පාරේ සිට ෆොන්සේකා පාර දක්වා මාර්ගය විවෘත කිරීම සඳහා ඉඩම් අත්පත් කරගැනීම වෙනුවෙන් 2018 පෙබරවාරි මස රු.4,500,000 ක් ප්‍රාදේශීය ලේකම් වෙත තැන්පත් කර තිබුණද 2021 වර්ෂය අවසන් වන විටත් ඉඩම් අත්පත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කොටසක් නොමිලේ ඉඩම් ලබා දීමටද අනෙක් කොටස විරුද්ධත්වයද ප්‍රකාශ කරන ලදී. විරුද්ධත්වය ප්‍රකාශ අයගේ ඉඩම් ලබා ගැනීම සඳහා ඉඩම් පවරා ගැනීමේ 38 (අ) අතුරු වගන්තිය යටතේ කටයුතු කිරීමට තීරණය කර ඇත. ඒ අනුව තක්සේරු දෙපාර්තුමේන්තුවෙන් ලබාගත් තක්සේරු වාර්තාව අනුව රු.4,500,000 ක මුදලක් අත්කර ගැනීම් වෙනුවෙන් වෙන් කරන ලෙස දන්වා ඇත. | නිසි පරිදි අවශ්‍යතා හඳුනා ගෙන අත්‍යාවශයම ව්‍යාපෘති පමණක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

**3.7 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 501(ඇ) ප්‍රකාරව රජයේ නිලධාරින්ට ලබාදුන් ණය සම්බන්ධව අත්තිකාරම් ගිණුම්වලින් පාඩු සිදුවීමක් අපේක්ෂා නොකරන බවද ණය මුදල් ගෙවීම් සඳහා අධිකාරි බලය ලබාදීමේදී නියම කරන ලද කොන්දේසි ප්‍රකාරව සම්පූර්ණ මුදලම අයකරගත යුතු බව දක්වා තිබුණද සභාවේ 2021 දෙසැම්බර් 30 දිනට රු.5,275,635 ක ණය ශේෂ අයකරගෙන නොතිබුණි. | 2022 වර්ෂය තුල රු.10,000 ට වැඩි ණය ශේෂයන් ඇති මුදල අය කර ගැනීමට හා රු.10,000 ට අඩුවෙන් ඇති ණය ශේෂයන් පොත් වලින් කපා හැරීමට අවශ්‍ය කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අංක 2155/6 හා 2019 දෙසැම්බර් 24 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ 08 වන වගන්තිය අනුව පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුගාමී මුදල් වර්ෂයේ පෙබරවාරි 28 දින හෝ එදිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන මසක් ප්‍රමාද වී 2022 මාර්තු 28 දින ඉදිරිපත් කර තිබුණි. | 2021 වර්ෂයේ පැවති කොරෝනා වසංගත තත්වය සමඟ කාර්යාලයට නිලධාරීන්ගේ පැමිණීමේ අඩුවක් පැවතුණි. එබැවින් නියමිත පරිදි ගිණුම් තොරතුරු එක්රැස් කර ගැනීමට ප්‍රමාද වූ බැවින් මෙම තත්වය ඇති වී ඇති අතර නිවැරදි දිනට ගිණුම් ඉදිරිපත් කිරීමට ඉදිරියේ දී වග බලා ගන්නා බව ද කාරුණිකව දන්වමි. | මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට නිසි පරිදි පිළියෙල කළ ඉදිරිපත් කළ යුතුය. |

**4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සභාව විසින් ඉටු කළ යුතුව තිබූ කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | 2021 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙළ කර ඇති අතර 2022 වර්ෂය සඳහා මේ වන විට සකස් කරමින් පවතී. | වර්ෂය ආරම්භ වීමට පෙර ක්‍රියාකාරී සැලැස්ම සකස්කර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |